විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ශ්‍රේණිය - 8

මාසය - නොවැම්බර් සතිය - 01 ක්‍රියාකාරකම් අංකය - 41

සැකසුම- එම්.එච්.ඩී.මධුමාලි ,ර/ඇඹි/ගජේයාය විද්‍යාලය ,ඇඹිලිපිටිය

## 6 - අන්තර්ජාලයේ සැරිසරමු

### 6.1 අන්තර්ජාලය සහ වෙබ් අතිරික්සු

**ශිෂ්‍ය කාර්යය -**

- පහත දී ඇති සටහන හොඳින් කියවා අවබෝධ කරගන්න.

**අන්තර්ජාලය සහ වෙබ් අතිරික්සු හඳුනා ගනිමු.**

- ලොව පුරා පිහිටි පරිගණක ජාලවල එකතුවක් සරලව අන්තර්ජාලය ලෙස අපි හඳුන්වනවා. අන්තර්ජාලය තුල ලෝකය පුරා සිටින මිනිසුන් නිර්මාණය කළ වෙබ් අඩවි මිලියන ගණනක් තියෙනවා.ඉතින් මෙන්න මේ විශාල තොරතුරු ප්‍රමාණය අතරින් අපට අවශ්‍ය තොරතුරු ලබාගන්න යෙදුම් මෘදුකාංගයක් අවශ්‍ය වුණා.හරියට අකුරු යතුරුලියනය කරන්න word මෘදුකාංගය භාවිතා කරනවා වගෙයි.අන්තර්ජාලයේ තොරතුරු සොයන්න යොදාගත් මෘදුකාංග වෙබ් අතිරික්සු ලෙස හැඳින්වූවා. (වැඩ පොතෙහි 44 පිටුව බලන්න.)

- ඔබගේ වැඩ පොතෙහි පිටු අංක 44 හොඳින් කියවා තේරුම්ගන්න.
- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- පහතින් දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ඔබ සතුව පරිගණකයක් හෝ ජංගම දුරකථනයක් තිබේනම් වැඩ පොතෙහි 6.1 ක්‍රියාකාරකමට අදාළ පියවර අනුගමනය කරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -**

- e නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=17993
  https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=19054
- වෙනත් -
  - Youtube- https://youtu.be/wCCQBMgfiJQ
    https://youtu.be/34rcCXJ-AAI

❖ සවියෙන් පෙරට - අපි එකට e- ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය - https://drive.google.com/file/d/1KFJOEo8NMtekAoSMZqZiFual1glMdW2/view?usp=sharing

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -**

- අන්තර්ජාලය සහ වෙබ් අතිරික්සු යනු මොනවාදැයි නිර්වචනය කරයි.
- අන්තර්ජාලය සහ වෙබ් අතිරික්සු භාවිතයේ අවශ්‍යතාව සහ වැදගත්කම හඳුනා ගනියි .
- එදිනෙදා කාර්යයන් පහසුවෙන් ඉටුකර ගැනීමට තොරතුරු තාක්ෂණය යොදා ගනියි.
- හොඳින් කියවා සහ සවන් දී අවබෝධයෙන් යුතුව පිළිතුරු සපයයි.

- **ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

1. ඔබ දන්නා බහුලව භාවිතා වන වෙබ් අතිරික්සුවක සංකේතයක් ඉවත දමන සෘජුෆෝම් හෝ කාඩ්බෝඩ් සහ වර්ණ A4 භාවිතයෙන් නිර්මාණය කරන්න . පාසල ආරම්භ කළ පසු එය ගුරුවරයාගේ සහාය ඇතිව පරිගණක ඒකකයේ බිත්ති පුවත්පත හෝ බිත්තියක් මත සවි කරන්න. (වැඩ පොතෙහි 44 පිටුව බලන්න)
2. අන්තර්ජාලයේ ඇති ප්‍රයෝජන මොනවාදැයි ලැයිස්තු ගත කරන්න.